# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2258/4 - 2021 දෙසැම්බර් මස 13 වැනි සඳුදා - 2021.12.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15 (1) වගන්තිය යටතේ නියමය

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15 (1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියමයෙන් කුරුණෑගල මහ නගර සභා සීමාව තුළ පිහිටි මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇති, කුරුණෑගල මහනගර සභාව සතු ඉඩම අද දින සිට නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරමි.

**මහින්ද රාජපක්ෂ** (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහළ,
"සුහුරුපාය" සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුණෑගල මහනගර සභා සීමාව තුළ විල්ගොඩ ගමේ පිහිටි ලියාපදිංචි මිනින්දෝරු හා තලමිතිකරු කෝලිත එස්. දිසානායක මහතා විසින් මැන පිළියෙල කරන ලද අංක 2020/S5 හා 2020.10.20 දිනැති දළ සැලැස්මේ කැබලි අංක 1න් නිරූපිත ප්‍රමාණයෙන් අක්කර 01 රූඩ් 03 පර්චස් 7.4 ක් පමණ වූ පහත සඳහන් මායිම්වලින් සමන්විත ඉඩම.

කැබලි අංක 01

| | | |
|---|---|---|
| *උතුරට* | : | පාර |
| *නැගෙනහිරට* | : | පාර (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ දළ සැලසුම් අංක 2020/S5 හි කැබලි අංක 3 |
| *දකුණට* | : | ඇළ |
| *බටහිරට* | : | අයිතිකරුවන් සහ හිමිකම් නොදන්නා ඉඩම |

1A - G 35552 -15 (2021/12)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.




EOG 12-0121